# ප්‍රධාන ලේකම් කාර්යාලය - වයඹ පළාත
## பிரதான செயலாளர் அலுவலகம் - வடமேல் மாகாணம்
## Chief Secretary's Office – North Western Province

පළාත් සභා කාර්යාල සංකීර්ණය, කුරුණෑගල - மாகாண சபை அலுவலகத் தொகுதி, குருநாகல் - Provincial Council Office Complex, Kurunegala.

**මූල්‍ය කළමනාකරණ අංශය**
நிதி முகாமைத்துவ பிரிவு
Financial Management Division


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எமது இலக்கம்<br>My No | NWP/CS/F/35/1/i | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | | දිනය<br>திகதி<br>Date | 2021.11.10 |

පළාත් භාණ්ඩාගාර( මුදල්) චක්‍රලේඛ අංක 03/2021

වයඹ ආණ්ඩුකාරවර ලේකම්,

ලේකම්, වයඹ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,

සභා ලේකම්, වයඹ පළාත් සභාව,

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,

සියළුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්,

සියළුම පළාත් දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානීන් වෙත.

**<u>ප්‍රජා පාදක සංවිධාන සඳහා සෘජු කොන්ත්‍රාත් පැවරීමේ ක්‍රමය</u>**

ප්‍රජා පාදක සංවිධාන සඳහා සෘජු කොන්ත්‍රාත් පැවරීමේ ක්‍රමය යන මැයෙන් භාණ්ඩාගාර ලේකම්ගේ අංක PED/PMD/Cir/2021/01 හා 2021.09.29 දිනැතිව නිකුත් කර ඇති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 2021/01, පළාත් සභාවට උචිත ආකාරයට සංශෝධනය කර පළාත් භාණ්ඩාගාර චක්‍රලේඛයක් ලෙස සකස් කර ඇති අතර එම චක්‍රලේඛය 2021.11.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි වයඹ පළාත් සභාවට අදාළ කර ගැනීම සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය, ආණ්ඩුකාරවර ලේකම්ගේ අංක NWP/GOV/AD/1/1/1/17/1 හා 2021.11.05 දිනැති ලිපියෙන් ලබා දී ඇත.

ප්‍රසම්පාදනයේ දී ප්‍රජා සහභාගීත්වය පිළිබඳව මාර්ගෝපදේශ නිකුත් කර ඇති රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය - 2006 හි 3.9 වගන්තිය හා ප්‍රසම්පාදන අතිරේක 3.9.1 හි සඳහන් විධිවිධානද පළාත් සභාවට උචිත අයුරින් පදනම් කරගෙන මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ.

2. ඒ අනුව, 2021.11.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ප්‍රජා පාදක සංවිධානවලට සෘජු කොන්ත්‍රාත් පැවරීමේ දී බලපැවැත්වෙන කොන්දේසි සහ අනුගමනය කළ යුතු ක්‍රියා පිළිවෙත පහත දැක්වේ.

2.1 දෙපාර්තමේන්තු ප්‍රධානියා නම් කරන නියෝජිතයකු සහ ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් නම් කරනු ලබන නියෝජිතයන් දෙදෙනෙකුගෙන් සමන්විත ත්‍රි පුද්ගල කමිටුවක් විසින් මෙහි අංක 2.3 යටතේ සඳහන් කර ඇති සුදුසුකම් පරීක්ෂා කර සනාථ කිරීමෙන් අනතුරුව පහත සඳහන් ප්‍රජා පාදක සංවිධාන වෙත ඉදිකිරීම් වැඩ කොන්ත්‍රාත් පැවරිය හැකිය.

I. සමෘද්ධි ප්‍රජා මූල සංවිධාන/සමෘද්ධි ප්‍රාදේශීය සංවිධාන

II. විවිධ සේවා සමුපකාර සමිති

III. සමුපකාර කම්කරු සමිති ( කම්කරු සේවා සඳහා පමණක්)

IV. ග්‍රාම සංවර්ධන සමිති




අධ්‍යක්ෂ (මුදල් හා ආදායම්)
இயக்குனர் (நிதி மற்றும் வருவாய்)
Director (Finance & Revenue)
Tel : 037-2223332
Fax : 037-2223332
e-mail: dirafinrevnwpc@gmail.com

ප්‍රධාන ලේකම් කාර්යාලය
பிரதான செயலாளர் அலுவலகம்
Chief Secretary's Office
Tel : 037-2231769-72
Fax : 037-2222234
e-mai : csnwp@sltnet.lk
Web site : www.cs.nw.gov.lk

නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය කළමනාකරණ)
பிரதி பிரதான செயலாளர் (நிதி முகாமைத்துவம்)
Deputy Chief Secretary (Financial Managment)
Tel : 037-2228128
Fax : 037-2223731
e-mail : dcsfnnwpc@gmail.com
dcsfinance@nw.gov.lk